# <u>12 ශ්‍රේණිය ආර්ථික විද්‍යාව 10 වන සතිය - ජූලි 6 සිට 10 දක්වා</u>

## <u>නිපුණතා මට්ටම 1.5 - සම්පත් බෙදා වෙන් කිරීම හා නිමැවුම බෙදා හැරීම පිළිබඳ තීරණ ගන්නා ආකාරය විග්‍රහ කරයි.</u>

- සම්පත්වල පවත්නා හිඟකම සහ හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන නිසා හැම සමාජයකටම මූලික තේරීම් තුනක් කිරීමට සිදුවේ.
- එම තේරීම් තුන සෑම සමාජයකටම පොදුය.
- ආර්ථික විද්‍යාවේදී මූලික ආර්ථික ප්‍රශ්න ලෙසින් හඳුන්වන්නේ එම තේරීම්ය.
- ඒ අනුව මූලික ආර්ථික ප්‍රශ්න වන්නේ,
  1.කුමක් කොපමණ නිශ්පාදනය කළ යුතුද?
  2.කෙසේ නිෂ්පාදනය කළ යුතුද?
  3.කා සඳහා නිෂ්පාදනය කළ යුතුද?

- සම්පත්වල හිඟකම සහ හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන තිබීම නිසා කවර සමාජයකට වුවද කුමක්/කොපමණ නිපදවනවාද යන මූලික ආර්ථික ප්‍රශ්නයට මුහුණ දීමට සිදුවේ.

  උදා - හිඟ සම්පත් උපයෝගී කර ගෙන පාරිභෝගික භාණ්ඩ නිපදවනවාද?ප්‍රාග්ධන භාණ්ඩ නිපදවනවාද?වශයෙන් නිපදවන භාණ්ඩය තීරණය කිරීමට සිදුවේ.

- එසේම නිපදවීමට තීරණය කළ භාණ්ඩය කොපමණ ප්‍රමාණයකින් නිපදවිය යුතුද යන්නත් තීරණය කළ යුතුය.

  උදා - ප්‍රාග්ධන භාණ්ඩ කොපමණද?

  **<u>අභ්‍යාස</u>**

  1.සම්පත් බෙදා වෙන් කිරීමේ ප්‍රශ්නය යන්න පැහැදිලි කරන්න.
  2.නිෂ්පාදනය පිළිබඳ ප්‍රශ්නය යන්න පැහැදිලි කරන්න.
  3.ආදායම් පිළිබඳ ප්‍රශ්නය යන්න පැහැදිලි කරන්න.
  4.භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කළ හැකි විකල්ප නිෂ්පාදන ශිල්ප ක්‍රම දෙක නම් කර ඒවා පැහැදිලි කරන්න.